ගරු කථානායක තුමා

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව

**<u>ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ පාඨමාලාව සිංහල හා දෙමළ මාධ්‍ය සිසුන්ට අහිමිකිරීම</u>**

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය 1959 අංක 23 දරන පාර්ලිමේන්තු පනත මගින් සංස්ථාපිත, මුදල් ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යංශයේ විෂය පථයට අයත් ආයතනයකි. ශ්‍රී ලංකාව තුළ ගණකාධිකරණ වෘත්තියට සාමාජිකයින් බිහිකිරීම සඳහා ජාතික මට්ටමේ විභාග පැවැත්වීම හා ඊට අදාළ පුහුණු කටයුතු සිදුකරන එකම ආයතනය ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය වේ.

1975 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා වර්ෂ 50 කට ආසන්න කාලයක් තුළ අන්තර් මධ්‍ය අදියරෙහි ප්‍රථම විභාග දෙක සඳහා පාඨමාලා මෙහෙයවීම හා විභාග පැවැත්වීම භාෂා තුනෙන්ම සිදුකරන ලදි. ඒ අනුව එම විභාග දෙක සමත්වීමෙන් සහතිකලත් ව්‍යාපාර ගණකාධිකාරිවරයෙකු ලෙස වෘත්තීය සුදුසුකම් ලැබීමටත් ඒ මගින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ක්ෂේත්‍රයේ වර්ධනයට විශාල දායකත්වයක් සිදුකිරීමටත් එම වෘත්තිකයිනට හැකියාව ලැබුනි. කෙසේ වුව ද 2023 වර්ෂයේ සිට අන්තර් මධ්‍ය අදියරෙහි දෙවන විභාගයේ (BL-2) විෂයයන් ක්‍රමයෙන් ඉංග්‍රීසි මාධ්‍යයට සීමාකරමින් පවතින නිසා සිංහල හා දෙමළ මාධ්‍ය සිසුන්ට සිදුව ඇත්තේ කිසිදු වෘත්තිය සුදුසුකමක් නොලබා මෙම පාඨමාලාවෙන් ඉවත්වීමටයි. ගණකාධිකරණ වෘත්තිය ඉංග්‍රිසි දැනුම සහිත පිරිසකට පමණක් සීමාකිරීම නිසා ග්‍රාමීය සිසුන් සමාජ අසහනයට ගොදුරු වීම තුළින් බරපතල සමාජ අර්බුදයක් නිර්මාණය විමේ හැකියාව මේ මගින් විවෘත වේ.

මෙම තත්ත්වය වැළැක්වීමට පාර්ලිමේන්තු මන්ත්‍රීතුමන්ලාගේ සහයෝගය අවශ්‍ය වන බැවින් ඒ සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා පාර්ලිමේන්තුව කල්දැමීමේ විවාදයක් ලබාදෙන මෙන් ඔබතුමාගෙන් ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිමි.

ගුණපාල රත්නසේකර

කුරුණෑගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී

පිටපත - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා

2023 ඔක්තෝබර් 04